
හා හා හරි හාවා
වාසනා ප්‍රකාශකයෝ
නිහාල් කුමාර

# හා හා හරි හාවා

හාවෝ කිව්වට හැමෝම එක වගේ නෙවෙයි. ඉතින් මේ කියන හාවා හරි පුදුම හාවෙක්. දක්ෂයි, කඩිසරයි, සූරයි ඒ වගේම කටකාරයි. හා අතරත් ජනප්‍රියයි. මේ හාවා එක්ක අමනාප වෙලා හිටියේ හා මස් රසට කැමති නරිරාලයි, තව එක දඩයක්කරුවෙකුයි විතරයි.

SL-Spirit

මෙයාට හැමෝම කිව්වෙ "හා හා හරි හාවා" කියලා. ඒකට හේතුව මෙයාගේ කටින් නිතරම පිට වෙච්ච වචනයක් තමයි "හා හා හරි" කියන එක.

දවසක් හා හා හරි හාවා කැලේ පැත්තට ගියා හොඳට හැදුණු උඳුපියලියා පඳුරක රස බලන්න.

"මේ ටිකේම ලැබුණු කෑම එච්චර හොඳ නෑ. අද නම් හොඳ උඳුපියලිය ටිකක් කන්න ලැබුණා" උඳුපියලිය රස බැලූ හාවා හිතුවා.

"හොඳට බඩ පිරුණා. මේ තියෙන්නෙ හොඳ තැනක්" කියලා හාවා ලොකු ගහකට හේත්තුවෙලා නිදා ගත්තා.

ඉතින් මේ හාවා එක්ක තරහින් හිටපු දඩයක්කාරයෙක් මේ වෙලාවෙ දඩයමක් හොයමින් කැලේ ඇවිද්දා. මෙයාගේ නම දඩමස්. එයා කැලේ ඒ මේ අත ඇවිදින කොට ගහකට හේත්තු වෙලා නිදාගෙන ඉන්න සුදු හාවව දැක්කා.

"හ්ම්... හාවෙක් නිදාගෙන ඉන්නවා. බලමු හිමින් ළං වෙලා. මොනවා! මේ අර හා හා හරි හාවානේ......."

දඩමස් ඇස් දෙක පිසදාගෙන නැවත ඒ දිහා බැලුවා. "ඔව්! මම හරි......" දඩමස්ට හරිම සතුටුයි.

"මේ හාවව අල්ලගන්න කී දවසක් උත්සාහ කළාද? අමාරුකාරයා හැමදාම පැන ගත්තනෙ. අද අතටම අහුවුණා"

දඩයක්කාරයා තුවක්කුව මානගෙන ටික ටික ළඟට ආවා.

සතුට වැඩිකමට එයා මෙහෙම සිංදුවක් කිව්වා.

"ලා ලා ලා ලලා හා මස් හරිම රසයි, මිරිස් දාලා කිරි හින්දලා, ඉස්ටු දාලා කොහොම කළත් හරිම හරි රසයි"

මේ සිංදුව ඇහිලා හාවට ඇහැරුණා. හාවා දැක්කා තුවක්කුව මානගෙන ඉන්න දඩයක්කාරයව. දැන් මොකද කරන්නෙ? හා හා හරි හාවා



ගැලවෙන්න උපායක් කල්පනා කළා.

ඇස් දෙක ඇරලා දඩයක්කාරයා දිහා බැලුවා. දඩමස් දිගට වැවුන

රැවුලින් වැහුන කට ඇරල පොඩ්ඩක් හිනාවුණා. හාවා බයවුණ බවක් පෙන්නුවෙ නෑ.

"චී චී බොහොම කැතයි දඩ මස්. නිදාගෙන ඉන්න සත්තු දඩයම් කරනවද? අනික නිදාගත්තු සතාගේ මස් රහ නෑ......."

"හා, හා ඒකෙන් කාරි නෑ. මම දැන් ඔහේට වෙඩි තියනවා. හ්ම්, සූදානම් වෙනවා මරණෙට" ඒ පාර දඩයක්කාරයා තරහෙන් කිව්වා.

"බේරුමක් නැති පාටයි" හාවා කල්පනා කරලා මෙහෙම කිව්වා. "හරි හරි ඔහේට පුළුවන්ද මගේ අවසාන ඉල්ලීම ඉෂ්ට කරන්න? මරණයට කැප වෙලා ඉන්න කෙනෙකුගේ අවසාන ඉල්ලීම ඉෂ්ට කිරීම යුතුකමක්"



"එහෙමද? මොකක්ද කියනවා බලන්න ඉල්ලීම" දඩමස් ගොරෝසු හඬින් කිව්වා.

"මට අවසාන භෝජනය වශයෙන් කැරට් අලයක් දෙනවද? මොකද කැරට්



අලයක් කටේ දාගෙන මැරෙන එක හොඳයි. මගේ ප්‍රියතම කෑමනේ"

"මම ළඟ ඇති කැරට් අලයක් නෑ. ඔහෙට ඕනෙනම් පාන් පෙත්තක් දෙන්න පුළුවනි. හැබැයි මාව රවට්ටන්න හදන්න එපා මගේ සුදු හා පැටියෝ තේරුණාද? මගේ හැටි දන්නවනේ." දඩමස් කිව්වා.

"හා හා හරි ෂෝක්. අපේ සීයා කියලා තියෙනවා පාන් කාපුවම මස් හොඳට වැඩෙනවලු" ඒක අහන් හිටපු හාවා කිව්වා.

"එහෙමද ආ, කනවකෝ මේක" කියලා දඩමස් සාක්කුවේ තිබුණ පාන් කෑල්ල හාවට දුන්නා.

පාන් කෑල්ල අතට ගත්තු හාවා "මේකනං මගේ එක කටටත් මදි. ඒත්

මේ කැල්ල මම කැවාම ඔහේට මොකුත් නැනෙ" කියලා කිව්වා.

"මෝඩ හාවා ඇයි මට හා මස් තියෙන බව අමතක වුණාද? ඉක්මන් කරනවා. මම දැන් තමුසෙට වෙඩි තියනවා. දහයයි, නවයයි, ......." දඩයක්කාරයා ගනින්න පටන් ගත්තා.

ඒක ගණන් නොගත් හාවා "හා හා හරි, මට අදහසක් ආවා මේ කැල්ල දෙකක් කරන්න. එතකොට ඔහේට කැල්ලයි මට කැල්ලයි. හා මස් හොඳට ලුණු ගම්මිරිස් දාලා උයලා පාන් එක්ක කෑවොත් තමා රස. මම දන්නවා ක්‍රම සහ විධි."

"ඇ මොකක්ද ඒ පාර නටන්න හදන නාඩගම" ගණන් කිරීම නවත්තල දඩමස් තරහෙන් කිව්වා. "ඕන් බලාගන්න" කිව්ව හාවා පාන් කැල්ල

උඩ විසි කළා. උඩ ගිය පාන් කෑල්ල දිහා දඬයක්කරු බැලුවා. පහළට වැටෙන පාන් කෑල්ල අල්ල ගන්න අතක්



SL-Spirit
A Place Like No Other

දික් කෙරුවා.

"හරි අල්ල ගත්තා" පාන් කෑල්ල අල්ලාගත් දඩයක්කරු හාවා දිහා බැලුවා. හාවා උන්නු ගහ යට කවුරුත් නෑ.

"හොර කපටි හාවා මම උඹව කොහොම හරි අල්ල ගන්නවා" ඈත දුවන හාවා දැකපු දඩයක්කරු වෙඩි තියන්න පටන් ගත්තා. "ඩෝං, ඩෝං" ඒත් ඒවා අහකට වැදුණෙ. "මෙහෙම තක්කඩි හාවෙක් මට කවදාවත් මුණ ගැහිලා නෑ" දඩයක්කරු කෝපයෙන් කෑ ගැහුවා.

බොහොම ස්තුතියි දඩමස්. මම යනවා ආයුබෝවන්, හාවා ඈතට ගිහින් හයියෙන් කිව්වා.

කැලෙන් එළියට පැන ගත්තු හා.



හා හරි හාවා ඊට පස්සෙ ගියේ නගරයට. නගරයේ කවුරුත් හාවා දිහා උනන්දුවෙන් බැලුවා. හාවට හිතුණා

හොඳ හෝටලයකින් කෑම වේලක් කන්න. "ටවුමට ආපු එකේ හොඳට බඩ පිරෙන්න කන්න ඕනා. කැලේ ඉඳලා දුවගෙන ඇවිල්ලා හරි මහන්සියි" කියලා හිතපු හාවා එක තැනක නැවතිලා හෝටලේක බෝඩ් එක දිහා බැලුවා. හෝටලයේ නමට යටින් මෙහෙම ලියලා තිබුණා.

"හා මස් ඉස්ටු, බැදපු හා මස් රසට අඩු මිලට"

SL-Spirit A Place Like No Other

"අම්මෝ! මේකට ගියොත් මාවත් රෝස් කරලා මේසෙට තියයි" හාවා තව ටිකක් එහාට ගියා. "මස් මාළු නැත. එළවළු කෑම පමණයි" කියලා බෝඩ් එකක් තිබුණා.

"හා හරි, මෙතනින් පුළුවන් කෑම කන්න" හෝටලය ඇතුළට ගිය හාවා පුටුවක ඉඳගත්තා.

මෙතනට ආව වේටර් කෙනෙක් "මොනවද මේ සුදු හාවට ඕනෙ?" කියලා ඇහුවා. හාවා චුට්ටක් හිනාවෙලා,

"උඳුපියලිය ලුණු මිරිසුයි, ලුණු දාලා තම්බපු කැරට් අලයි ගේන්න........."

"කනගාටුයි, උඳුපියලිය නම් නෑ. කැරට් අලයක් නම් ඉක්මනට තම්බලා දෙන්න පුළුවනි. මොකද මේ හෝටලයට හාවෝ එන්නෙ කලාන්තරකින්නේ"

SL-Spirit
A Place Like No Other

"අයියෝ, මොනවද මේ හෝටලයේ තියෙන්නෙ. මට හරි බඩගිනියි. අමුවෙන් හරි මට කැරට් අලයක් ගේනවා" හාවා ටිකක් තරහෙන් කිව්වා.

"හරි හරි කලබල වෙන්න එපා. මම ගේන්නම්." වේටර් ගියා කැරට් අලයක් ගේන්න. හෝටලේ කෑම කන්න ආපු අය හාවා දිහා බලාගෙන හිටියා.




SL-Spirit
A Place Like No Other

කෑම කන්න ආපු වෙනත් අය අතරේ හිටපු පුංචි ළමයෙක්,

"අම්මෙ අර හාවව අපි ගෙදර අරන් යමුද? මට ආසයි ඌත් එක්ක සෙල්ලම් කරන්න" මේ ළමයාගේ කතාව හාවට ඇහුණා.



SL-Spirit A Place Like No Other

"මොනවා! මේ ළමයට සෙල්ලම් කරන්න වෙන මොකුත් නැතිවද? හරිම පුදුම ළමයි.........." හාවා කිව්වා.

හාවාගේ කැරට් අලය ඉක්මනටම ලැබුණා. කටට දෙකට කැරට් අලය ගිලලා දාපු හාවා,

"අමුවෙන් උනත් ටවුමේ කැරට් රසයි වගේ. මේ වේටර් උන්නැහේ ඔහේට බොහොම ස්තූතියි. එහෙනම් මම ගිහින් එන්නම්" කියලා කිව්වා.

"එහෙම යන්න දෙන්න බෑ කැරට් අලේ බිල ගෙවලා යන්න. හිතුවද මේක දන්සැලක් කියල"

හෝටලේ හිටපු අනිත් අය හිනා වෙන්න ගත්තා. හාවා ගානක් නැතිව වතුර වීදුරුවක් බිව්වා.

වේටර් දිහා හිනාවෙලා බැලුවා.

"මොකක්ද බිල කියන්නෙ ?"

"ගාස්තුව, කෑම ගාස්තුව" වේටර් කිව්වා.

"හා හරි හරි, කියනවකො එහෙනම් තමුසෙගේ ගාස්තුව" හාවා කිව්වා.

"ඇතුල්වීමේ ගාස්තුව රුපියල් 2 යි. පිටවීමේ ගාස්තුව රුපියල් 5 යි. කැරට් අලයට රුපියල් 5 යි. ළඟට ගෙනාපු මට රුපියල් 2 යි. ඔක්කොම ගාන රුපියල් 14 යි. ඒක තමයි තමාගේ බිල"

හාවට දාඩිය දැම්මා. "යකෝ මාර තැනක්නෙ මෙතන! ඒ මොන ගානක් කිව්වත් මා ළඟ සතයක්වත් නෑනෙ" හාවා එහෙම හිතුවා.

"හලෝ, මේ ගානනම් ටිකක් වැඩියි



තමයි. ඒත් මගේ පර්ස් එක මඟදී වැටිලා සල්ලි දෙන්න විදිහක් නෑනේ"

"පුළුන් ගෙඩිය වගේ ලස්සනට හිටියට කපටි හාවෙක් වගේ" වේටර් කිව්වා.

"නෑ, නෑ බොරුවක් නෙමේ. මේ ඇත්තමයි වේටර් මහත්තයෝ මම කියන්නේ" හාවා වේටර්ගේ මූණ දිහා බැලුවා.

SL-Spirit A Place Like No Other

"ඒකට අපිට කරන්න දෙයක් නෑ. එහෙනම් බිලේ ගානට හරියන්න කුස්සියේ වැඩ කරන්න වෙයි" වේටර් කිව්වා.

"හා හරි හරි. ඒක මට පුළුවන්. ඉතින් වෙන මොනවා කරන්නද? මටමනේ වෙන්නේ"

"යමු, යමු" වේටර් ඉක්මනට හාවව

කුස්සියට එක්කගෙන ගියා. හාවව දැකපු කුස්සියේ හිටපු කෝකියා,

"ආ...., කාලෙකින් දැක්කෙ හොඳට මස් තියෙන හාවෙක්. කොල්ලා මේ හාවව අපේ රෑ බතට ඉස්ටු දාන්නද"

"මොනවා! මේ යකා මාව කන්න බලන් ඉන්නෙ. මේ වේටර් උන්නැහේ මාව මසට ගන්නද මෙහෙට ගෙනාවෙ"

SL-Spirit

"නෑ, නෑ, කෝකි අයියේ. මේ හාවට කැරට් කාලා බිල ගෙවන්න සල්ලි නෑ. එයාගෙ පර්ස් එක නැති වෙලාලු. ඒක නිසා ඒකට හරියන්න කුස්සියෙ වැඩ කරන්න කියලා මම කිව්වෙ" වේටර් කිව්වා.

"එහෙමද? එනවා හාවා මෙහාට. මට දර ටිකක් පළලා දෙනවා" කෝකියා කිව්වා. වේටර් ආපහු ගියා.




"දර පළන්න ඇඟට හොඳට හයිය ඕනනේ" කුස්සියෙ රාක්කෙ තියෙන කැරට් අල දිහා බලලා හාවා කිව්වා.

"මේකෙන් අලයක් කාලම මම දර පළන්නම්කො" හාවා ඒකෙ තිබුණ කැරට් අලයක් කන ගමන් කිව්වා.

මේක දැකපු කෝකියට හොඳටම තරහා ගියා. "තමුසෙ මෙතෙන්ට ආවෙ ආයේ කැරට් කන්නද? හොර හාවා...." කෝකියා කුස්සියෙ තිබුණ කොස්ස අරගෙන හාවට ගහන්න පැන්නා. හාවා ඒ මේ අතට පැන්නා. කුස්සියෙ බඩු හැමතැනම පෙරළුනා. කෝකියට තවත් තරහයි. එක පාරක්වත් වැදුණේ නැහැ.

බැරිම තැන හාවා කුස්සියෙන් එළියට පැන්නා. කුස්සියෙ එළිපත්ත උඩ හිටපු බල්ලා හාවව දැකලා ඌව අල්ලගන්න බුරාගෙන පැන්නා.

"අල්ලපන් දඩෝරියා ඔය හාවව...... අල්ලලා මෙහාට අරං වරෙං" කෝකියා තරහෙන් කෑ ගැහුවා.



ඒක ඇහුණ දඬෝරියා හාවා පස්සේ එලවගෙන ගියා.

"හා හා හරි, දඬෝරියා අල්ලයි මගෙ වල්ගෙ" කියලා හාවා ඒ මේ අත පැන පැන දිව්වා. දඬෝරියත් පස්සෙන් එලවගෙනම ගියා.



හෝටල් වත්තෙ පල්ලෙහා තිබුණා පොල්ලෙලි ගොඩක්. එතන නැවතුණ හාවා පොල්ලෙල්ලක් අතට ගත්තා.

දඩෝරියා බුරාගෙන හාවා ළඟට පැන්නා. හාවා පොල්ලෙල්ල දඩෝරියගේ කටට එබුවා.



SL-Spirit A Place Like No Other

පොල්ලෙල්ල කටේ හිරවුණ දඬෝරියා ඒක ගලෝ ගන්න බැරිව බිම පෙරළෙන්න ගත්තා.

"දඬෝරියා ඔහේට මහන්සි ඇතිනේ, ඔහොම ටිකක් ඉන්නවා. මම ගිහිල්ලා එන්නම්" කියලා හාවා යන්න ගියා. නිකම්ම නෙමේ, ලස්සන සිංදුවක් එහෙම කිය කියා.

දඬෝරියාට කෝපය ඉවසගන්න බෑ. ඒත් ඌට බුරන්නත් බෑ. පොල්ලෙල්ල කටේ හිරවෙලා.

මේ හා හා හරි හාවාගේ එක කතාවක් විතරයි.